ඇතැම් මාධ්‍ය මගින් පුවතකට සෘජුවම අදාළ නොවන අවස්ථාවන්හි පවා පුද්ගලයින්ගේ වාර්ගිකත්වය පුවත තුළ සඳහන් කරනු දක්නට ලැබෙනා කරුණකි. එසේම මෙසේ සඳහන් වන වාර්ගිකත්වයන් 'දමිළ' හෝ 'මුස්ලිම්' වීමත්, ඊට සමාන පුවත් වාර්තාවන්හි වුවද 'සිංහල' වැනි වාර්ගිකත්වයන් සඳහන් නොවීමත්, මෙම ගැටළුව අවබෝධ කරගැනීම සඳහා අදාළ වනු ඇත. මෙසේ පුවතකට සෘජුව අදාළ නොවන විටක වාර්ගිකත්වය නොදැක්වීම, ශ්‍රී ලංකා කර්තෘ සංසදයෙන් හඳුන්වා දුන් ආචාර ධර්ම මාලාවේ මෙන්ම ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්මයන් තුළද සඳහන් වන කරුණකි.

මීට උදාහරණ ලෙසින් පහත සති අග අරුණ (02/21) සහ අරුණ (02/24) පුවත් වාර්තාවන් දැක්විය හැක. මෙම පුවත් වාර්තාවන් තුළ වාර්ගිකත්වයන් දැක්වී ඇතත්, එම වාර්ගිකත්වයන් එම පුවත් වාර්තාවන් සඳහා අදාළ වේ යැයි ඔබ සිතන්නේද? එසේ අදාළ නොවන වාර්ගිකත්වයක් දැක්වීම එසේ නම් මාධ්‍ය ආචාර ධර්ම විරෝධී මාධ්‍යකරණයක් නොවේද?

#MediaEthicsSL #lka #SinhalaPress #SathiAgaAruna #Aruna